සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2020 ජනවාරි

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

2020-01-18
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**කුමාර** සහ **මුදිත** ව්‍යාපාර පරිපාලන උපාධි හිමි මිත්‍රයෝ වෙති. ලිපිද්‍රව්‍ය ආනයනය කර විකිණීමේ ව්‍යාපාරයක් ඔවුන්ගේ විශ්ව විද්‍යාලය ආසන්නයේ ආරම්භ කිරීමට ඔවුහු තීරණය කළහ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **කුමාර** සහ **මුදිතට** ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා පිහිටුවිය හැකි සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) ඉහත දෙන ලද ව්‍යාපාරය කෙරෙහි බලපෑ හැකි ආර්ථික සාධක තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

අඛණ්ඩ පැවැත්ම උපකල්පනය යටතේ අස්තිත්වය එහි මෙහෙයුම් කටයුතු පෙනෙන අනාගත කාලයක් පුරා පවත්වාගෙන යනු ලබන බවට උපකල්පනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

අඛණ්ඩව පැවතීමක් ලෙස අස්තිත්වයට නොකඩවා කරගෙන යාමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු තරමේ සැක පහළ කෙරෙන මූල්‍ය සිදුවීම් හෝ තත්ත්වයන් (financial events or conditions) සඳහා උදාහරණ තුනක්(03) ද, මෙහෙයුම් සිදුවීම් හෝ තත්ත්වයන් (operating events or conditions) සඳහා උදාහරණ දෙකක්(02) ද **ලැයිස්තුගත කරන්න**.

(ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සිවා, සීමාසහිත HS හෝල්ඩින් සමාගමේ,** 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය කරන විගණන කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ විගණකවරයෙක් වේ.

සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු සම්බන්ධයෙන් පහත සඳහන් විගණන පටිපාටි **සිවා** විසින් ඉටුකර ඇත:

- පෙර වර්ෂයේ වැඩ පත්‍රිකා සමාලෝචනය කරන ලදී.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා සමාලෝචනය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සියලුම ප්‍රමාණාත්මක සම්බන්ධිත පාර්ශව ගනුදෙනු අනාවරණය කර ගැනීමට විගණකගෙන් අපේක්ෂා කළ නොහැකිවන අවස්ථාවන් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) සම්බන්ධිත පාර්ශවයන් සමග ගනුදෙනු විගණනය කිරීමේදී ඉහත සඳහන් ඒවා හැර **සිවා** විසින් ඉටුකරනු ලබන විගණන පටිපාටි තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

වරලත් ගණකාධිකාරී ආයතනයක් වන **W. ඇසෝසියේට්ස්,** ආයතන මට්ටමින් සහ තනි තනි විගණන කාර්යභාර මට්ටමින් තත්ත්ව පාලන පද්ධතියක් (quality control) පිහිටුවා පවත්වාගෙන යයි. ඔබ, **W. ඇසෝසියේට්ස්** ආයතනයේ විගණන කළමනාකරු ලෙස පත්කරනු ලැබ ඇති අතර, විගණන පුහුණුව ලබන්නන් විසින් කරනු ලබන වැඩ සමාලෝචනය කිරීම ඔබ විසින් කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කාර්යභාර විගණනයක් සිදුකිරීමේදී "සමාලෝචනය" (review) යටතේ ඇතුළත් කරනු ලබන ක්‍රියාකාරකම් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) ආයතන මට්ටමින් පවත්වාගෙන යනු ලබන තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග (elements) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

සහතිකවීමේ කාර්යභාරයක් යනු විෂය කරුණේ තොරතුරු පිළිබඳව වගකිවයුතු පාර්ශවය හැර, අපේක්ෂිත පරිශීලකයන්ගේ විශ්වාසයේ ප්‍රමාණය වැඩි කිරීමට සැලසුම්කරන ලද නිගමනයක් ප්‍රකාශ කිරීම වෙනුවෙන් වෘත්තිකයෙකු විසින් ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබාගැනීමේ අරමුණින් කරනු ලබන කාර්යභාරයකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) සහතිකවීමේ කාර්යභාරයක් බාර ගැනීමේදී හා අඛණ්ඩව කරගෙන යාමේදී ඉටු කළ යුතු ප්‍රධාන අවශ්‍යතාවයන් තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත සාරා ට්‍රේඩින් (පෞද්ගලික) සමාගමේ** 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයෙහි යෙදී සිටින, වරලත් ගණකාධිකාරී ආයතනයක් වූ **ජෝර්ජ් ඇසෝසියේට්ස්හි** විගණනය භාර ජ්‍යෙෂ්ඨයා ඔබය. පහත සඳහන් තොරතුරු විගණන ලිපිගොනුවේ ඇතුළත් විය:

(1) විගණනය සැලසුම්කරන අදියරේදී භාවිත කල විගණන ප්‍රමාණාත්මක බව, ලාභය මත පදනම්ව රු.1,700,000/- කි.

(2) ආයතනයේ කාර්යාල ගොඩනැගිල්ලක ඉදිකිරීම් කටයුතු 2019 ඔක්තෝම්බර් 01 දින නිමකරන ලද අතර, එය එදින සිට පාවිච්චි කිරීමට තිබේ (available for use). ගොඩනැගිල්ලේ ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 120 කි.

(3) ගොඩනැගිලි, සරල මාර්ගික ක්‍රමයට, පිරිවැය මත වර්ෂ 30 ක කාලයක් පුරා ක්ෂය කරනු ලැබේ.

(4) මෙම නව කාර්යාල ගොඩනැගිල්ල 2020 ජනවාරි 01 දින විවෘත කරන ලද අතර, සමාගම විසින් එදින සිට ක්ෂය කරන ලදී.

(5) සමාගම විසින් මෙම නව ගොඩනැගිල්ල මත 2019 ඔක්තෝම්බර් 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලයට රු. මිලියන 1.5 ක ණය පිරිවැය ප්‍රාග්ධනිත කරන ලදී.

**ඔබ විසින් කල යුතු දෑ:**

(a) **සීමාසහිත සාරා ට්‍රේඩින් (පෞද්ගලික) සමාගමේ** 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල විගණන මතය කෙරෙහි ඉහත දැක්වූ කරුණුවල බලපෑම **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(b) ප්‍රමාණාත්මක සහ යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි වන්නේ නම්, ප්‍රකාශ කළ යුතු විගණන මතයේ වර්ගය **හඳුනාගන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත මහේල (පෞද්ගලික) සමාගමේ** දැනට සිටින විගණක (**RS ඇසෝසියේට්ස්**) පසුගිය මූල්‍ය වර්ෂයේ විගණන වාර්තාව බාරදීමේ ප්‍රමාදය හේතුවෙන් ඔවුන් වෙනස් කිරීමට සමාගම සලකා බලමින් සිටින අතර, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා සමාගමේ ව්‍යවස්ථාපිත විගණක ලෙස **TM ඇසෝසියේට්ස්** පත්කිරීම පිළිබඳව **සීමාසහිත මහේල (පෞද්ගලික) සමාගමේ** කළමනාකරණ අධ්‍යක්ෂක සාකච්ඡා කරමින් සිටී.

**ඔබ විසින් කල යුතු දෑ:**

(a) දැනට සිටින විගණක (**RS ඇසෝසියේට්ස්**) ඉවත් කර නව විගණකවරයෙක් පත් කිරීමේදී (replacing the existing auditor), **සීමාසහිත මහේල (පෞද්ගලික) සමාගම** අනුගමනය කළ යුතු පටිපාටි දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) ව්‍යවස්ථාපිත විගණක ලෙස පත්වීම බාරගැනීමෙන් පසු **TM ඇසෝසියේට්ස්** විසින් ඉටුකළ යුතු පටිපාටි දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(B) වෘත්තිමය සහ ව්‍යාපාරික සම්බන්ධතාවල ප්‍රතිඵලයක් වශයෙන් ලබාගත් රහස්‍ය තොරතුරු තමන්ගේ හෝ තුන්වන පාර්ශවයන්ගේ පුද්ගලික වාසියට භාවිත කිරීමෙන් වැළකිය යුතු බවට බැඳීමක් සියලුම වෘත්තීය ගණකාධිකාරීවරුන් වෙත රහස්‍යභාවය පිළිබඳ මූලධර්මය මඟින් පනවා තිබේ. එසේවුවත්, වෘත්තීය ගණකාධිකාරීවරුන්ට රහස්‍ය තොරතුරු අනාවරණය කිරීමට අවශ්‍ය කෙරෙන අවස්ථා තිබිය හැකිය.

**ඔබ විසින් කල යුතු දෑ:**

වෘත්තීය ගණකාධිකාරීවරුන්ට රහස්‍ය තොරතුරු අනාවරණය කිරීමට අවශ්‍ය විය හැකි අවස්ථා දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත HL හොටෙල්ස් පොදු සමාගමේ** සහකාර ගණකාධිකාරිණියක ලෙස **තිලාෂි** මෑතකදී බඳවාගනු ලැබුවාය. මෙම හෝටලයේ කළමනාකරණයට සම්බන්ධ නොවන කොටස්හිමියන් 10,000 කට ආසන්න ගණනක් සිටින බව අනුස්ථාපන වැඩසටහනේදී (induction program) **තිලාෂි** දැන ගන්නා ලදී. සමාගමේ කොටස්හිමියන් විසින් පත්කරනු ලැබූ අධ්‍යක්ෂවරුන් 5 දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

අනුස්ථාපන වැඩසටහනෙන් පසු ගණකාධිකාරී විසින් රැකියා විස්තරය (job description) පිළිබඳව සහ හෝටලයේ මිලදී ගැනීම් ක්‍රියාවලියේ (procurement), පහත සඳහන් අංශ පිළිබඳව **තිලාෂිට** දන්වන ලදී:

- සියලුම ප්‍රාග්ධන අයිතම මිලදී ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව වේ.
- සියලුම අයිතම සැපයීම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවෝ සිටිති. මිලදී ගැනීමේ කමිටුව (procurement committee) හරහා මූල්‍ය කළමනාකරු විසින් අනුමත කළහොත් මිස අයිතමවල මිල වෙනස් නොවේ.
- තොග සඳහා අවශ්‍යතාව පැන නැගුණ විට පද්ධතිය මගින් ජනනය කළ ඉල්ලීම් සටහන් [Request Notes (RNs)], මගින් ගබඩා කළමනාකරුට ඒ බව දන්වනු ලැබේ. අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ඉල්ලීම් සටහන් (RNs), අනුමත කරනු ලැබේ.
- සහකාර ගණකාධිකාරී විසින් පද්ධතිය මගින් ජනනය කළ ගැනුම් ඇණවුම් [Purchase Orders (POs)] පිළියෙළ කරනු ලැබේ. වටිනාකම රු.200,000/- ට නොවැඩි මිලදී ගැනුම්, ගණකාධිකාරී විසින් අනුමත කරනු ලබන අතර, වටිනාකම රු.1,000,000/- දක්වා වූ මිලදී ගැනුම්, මූල්‍ය කළමනාකරු විසින් අනුමත කරනු ලැබේ.
- අයිතම ලැබෙන වේලාවේදී, ගබඩා ලිපිකරු විසින් භාණ්ඩ ලැබීමේ සටහන් [Goods Received Notes (GRNs)] ජනනය කරනු ලබන අතර, එදිනම එය පරිගණකගත පද්ධතියට ඇතුළත් කරනු ලැබේ.
- සැපයුම්කරුගේ ඉන්වොයිසි මත ගෙවීම් කරනු ලබන විට, ගෙවීම් වවුචරය ජනනය කිරීමට පෙර, සහකාර ගණකාධිකාරී විසින් එය ගැනුම් ඇණවුම (PO) සහ භාණ්ඩ ලැබීම් සටහන (GRN) සමඟ එකඟදැයි බැලිය යුතුය.
- ගෙවීම් වවුචර් අනුමත කිරීම සහ චෙක්පත් අත්සන් කිරීම කළ යුත්තේ අත්සන්කරුවන් සඳහා පනවා ඇති අනුමත සීමාවන් තුළයි.

මූල්‍ය වාර්තාකරණය සඳහා සමාගම පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක් භාවිත කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංයුක්ත පාලනය සඳහා වූ යහපත් පරිචයන් අඩංගු සංග්‍රහයෙහි (Code of Best Practice on Corporate Governance) දක්වා ඇති, අධ්‍යක්ෂකවරුන් විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ (guidelines) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත අස්තිත්වයන් සඳහා අදාළවන සංයුක්ත පාලන මාර්ගෝපදේශ අනුව **සීමාසහිත HL හොටෙල්ස් පොදු සමාගමේ** පිහිටවිය යුතු කමිටු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) **සීමාසහිත HL හොටෙල්ස් පොදු සමාගමේ** මිලදීගැනීමේ ක්‍රියාවලියේ (procurement process) ශක්තීන් (strengths) පහක්(05) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(d) ඉහත (c) හි හඳුනා දැක්වූ එක් එක් ශක්තීන් සඳහා අරමුණක් බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 05)

(e) **සීමාසහිත HL හොටෙල්ස් පොදු සමාගමේ** පිහිටුවිය යුතු පාලන පරිසරයේ මූලිකාංග දෙකක්(02) සහ පාලන ක්‍රියාකාරකම් තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 05)

(f) දත්ත ගොනුවලට අනවසර සංශෝධනය කිරීම් වැළැක්වීම සඳහා පොදු පාලනයන් (general controls) දෙකක්(02) සහ යෙදවුම්වල නිවැරදිතාවය පිළිබඳ පාලනය කිරීම සඳහා තිබෙන භාවිත පාලනයන් (application controls) දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

දේශීය වෙළෙඳපොළෙහි රෙදිපිළි නිෂ්පාදනය කර විකිණීමේ යෙදී සිටින **සීමාසහිත ශ්‍රීනා ෆැබ්රික්ස් පොදු සමාගමේ** ව්‍යවස්ථාපිත විගණනයේ ජ්‍යෙෂ්ඨ විගණක ඔබ වේ. සමාගම පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවියේ තිබේ. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා විගණනය පිළිබඳ විගණන සැලසුම් ලියවිල්ලෙන් (planning memo) සහ වැඩ පත්‍රිකාවලින් (working papers) විගණන කාර්යභාරයට අදාල පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

- සමාගමේ ණයගැතියන් ආයතනික ගනුදෙනුකරුවන්ගෙන් (corporate customers) සමන්විත වන අතර, ඔවුන්ට දින 30 ක ණය පියවීමේ කාලයක් දෙනු ලැබේ.
- 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති ණයගැතියන්ගේ ශේෂය රු. මිලියන 128 ක් විය.
- 2019 දෙසැම්බර් 31 දිනට ණයගැති වයස් විශ්ලේෂණය (age analysis) පහත සඳහන් පරිදි විය:

| දින 30 ට වඩා අඩු (රු. මිලියන) | දින 30 සිට දින 60 අතර (රු. මිලියන) | දින 60 සිට දින 90 අතර (රු. මිලියන) | දින 90 සිට දින 365 අතර (රු. මිලියන) | දින 365 ට වැඩි (රු. මිලියන) |
|---|---|---|---|---|
| 28 | 12 | 32 | 48 | 08 |

- 2019 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 80 ක ණය ශේෂයක් තිබූ ණයගැතියෙකු ඔහුගේ ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම නිසා සැලකිය යුතු තරමින් ඇණවුම් අඩුකර තිබූ බව 2020 ජනවාරි 10 දිනවන විට දැනගැනීමට ලැබී තිබුණි.
- 2020 ජනවාරි 15 දින වනවිට ණයගැතියන්ගෙන් පසුව ලැබී තිබුණේ රු. මිලියන 1.5 ක් පමණකි.
- දින 365 කට වඩා හිඟව තිබූ ණය ශේෂයන් සඳහා 100% ක හානිකරන ප්‍රතිපාදනයක් (impairment provision) සිදු කරනු ලැබේ.
- විකුණුම් විධායක වෙත ගනුදෙනුකරුවන්ගෙන් ඇණවුම් ලැබෙන අතර ඉන්වොයිසි පිළියෙල කිරීම සඳහා ගිණුම් විධායක වෙත විද්‍යුත් තැපැල් මඟින් දන්වනු ලැබේ. එම අවස්ථාවේදීම අයභාරය හඳුනාගනු ලැබේ.
- ගනුදෙනුකරුවන් සමාගමේ කර්මාන්තශාලාවෙන් භාණ්ඩ ලබාගන්නා අතර, එම අවස්ථාවේදීම ගනුදෙනුකරුවන් භාණ්ඩ ලැබුණු බව ඉන්වොයිසි පිටපත්වල සටහන් කරන අතර ඊළඟට ඒවා මූල්‍ය අංශය වෙත යවනු ලැබේ.
- වර්ෂය සඳහා අයවැයගත ආදායම ළඟා කරගැනීම වෙනුවෙන් ප්‍රධාන විධායක නිළධාරි සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් වෙත ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණනයක් සඳහා නිසි සැලැසුමක් අවශ්‍ය වන්නේ ඇයිදැයි හේතු හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(b) **සීමාසහිත ශ්‍රීනා ෆැබ්රික්ස් පොදු සමාගම** පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා භාවිත කළ හැකි ප්‍රභවයන් (sources) පහක්(05) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 05)

(c) විගණන පටිපාටි ඉටුකිරීමේදී **සීමාසහිත ශ්‍රීනා ෆැබ්රික්ස් පොදු සමාගමේ** විශේෂ අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍ර හයක්(06) **හඳුනා දක්වන්න.** (ලකුණු 06)

(d) ණයගැතියන්ගේ ශේෂය විගණනයේදී ඉටුකළ යුතු විගණන පටිපාටි හතරක්(04) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 04)

(e) විගණන සාක්ෂි ලබාගැනීමේ විගණන පටිපාටි වර්ග තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |